# ජනාධිපතිගේ දීපාවලි පණිවිඩය

ශ්‍රී ලංකා ජනාධිපති

இலங்கை சனாதிபதி

President of Sri Lanka

**පණිවුඩය**

ආධ්‍යාත්මික ශික්ෂණය, ප්‍රඥාව බඳු ගුණාංග මිනිස් සිත් සතන් තුළ ඇතිවීමට නම් අවිද්‍යාවේ අන්ධකාරය පහ විය යුතුය. එකී අරමුණ සාක්ෂාත් කරගනු වස් ලෝකවාසී හින්දු බැතිමතුන් පහන් දල්වා සමරන දීපාවලි උලෙළ වෙනුවෙන් සුබපැතුම් එක් කිරීමට ලත් අවස්ථාව පිළිබඳ බෙහෙවින් සතුටු වෙමි.

පහනින් නැගෙන ආලෝකයෙන් අයහපත නමැති අඳුර දුරුවී යහපත නමැති ආලෝකය පැතිරෙන්නා සේ ස්වකීය ජීවිත ද ආලෝකවත් වේ වා යන්න දීපාවලියේ අරුතයි. ඒ සමඟම එකිනෙකා වෙත හෘදයාංගම සුබපැතුම් පිරිනමමින්, සෙනෙහස බෙදා හදා ගන්නා සංස්කෘතික උලෙළක් ලෙස ද දීපාවලිය ජනතාව සහෝදරත්වයේ හුයෙන් එකිනෙකා බැඳ තබයි.

දශක කිහිපයක් තිස්සේ විරසකයන් විසින් හුදකලා කරනු ලැබ අනේක විධ දුක්ඛ වේදනාවන් දරා සිටි සමාජයක ජනවර්ග අතර පවත්නා විරසකය දුරලා, අන්‍යෝන්‍ය අවබෝධයත්, සහජීවනයත් ඇති කිරීමට දීපාවලි උලෙළ මනා පිටිවහලක් වනු ඇත. ඒ බව මනාව වටහා ගනිමින් උදාවන දීපාවලි උත්සවය අප අතර, සංස්කෘතික බැඳීමක් ගොඩනගාගත හැකි අගනා අවස්ථාවක් බවට පත් කර ගත යුතු බව මගේ හැඟීමයි.

නපුර දුරලන දීපාවලි උත්සවය සතුටින් මෙන්ම අර්ථාන්විතව සමරමින් ආදරය සහ යහපත් ගුණාංගයන් වගා කර ගැනීමට උත්සුක වන මෙරට මෙන්ම, ලොව පුරා වෙසෙන සියලු හින්දු බැතිමතුන්ටත් මාගේ සුබපැතුම් පිරිනමමි.

මෛත්‍රීපාල සිරිසේන

2018 නොවැම්බර් මස 06 වන දින

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு

Democratic Socialist Republic of Sri Lanka

අනුග්‍රහය: ජනාධිපති මාධ්‍ය ඒකකය